සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 S II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ........................................ ඉතිහාසය - I කාලය : පැය 01 යි.

සැළකිය යුතුයි:-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (✗) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලිය වී ඇති මූලාශ්‍ර කෘතිය වන්නේ මින් කුමක් ද?
1. මහා වංශය 2. දීප වංශය 3. රසවාහිනිය 4. චූල වංශය

02. පහත සඳහන් කතුවරුන් අතුරින් ලංකාවට නොපැමිණි වෙනත් අයගෙන් ලබාගත් තොරතුරු ඇසුරින් ලංකාව පිළිබඳ වාර්තා සැපයූ ලේඛකයෙකු වන්නේ කවුරුන් ද?
1. රිබෙයිරෝ 2. රොබට් නොක්ස් 3. ප්ලිනි 4. පිලිප්පස් බැල්දියස්

03. අග්නි හා පර්ජන්‍ය යන දෙවිවරුන් නිරූපණය සඳහා අනුරපුරයේ නිර්මාණය කර ඇති මූර්තිය කුමක් ද?
1. මිනිසා හා අශ්ව හිස 2. ඉසුරුමුණි පෙම් යුවල
3. සඳකඩ පහණ 4. දොරටුපාල රූප

04. පහත A හා B යටතේ ඇති ප්‍රකාශ නිවැරදිව ගැලපූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| (i) | වෙරළාසන්න එළිමහන් වාසස්ථාන | A | බෙල්ලන් බැඳි පැලැස්ස |
| (ii) | පහතරට තෙත් කලාපීය ලෙන් | B | පතිරාජවෙල |
| (iii) | පහතරට වියළි කලාපීය ලෙන් | C | කිතුල්ගල බෙලි ලෙන |
| (iv) | තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන | D | පොතාන |

1. ADBC 2. ADBC 3. BDAC 4. BCDA

05. වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගෙවා වර්ෂා කාලවල දී ස්වාභාවික ගල්ගුහාවල ජීවත්වූයේ පහත සඳහන් කුමන යුගයේ මානවයින් ද?
1. පූර්ව ඓතිහාසික යුගය 2. මුල් ඓතිහාසික යුගය
3. ප්‍රාග් ඓතිහාසික යුගය 4. සිලුරීයන් යුගය

06. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණික දියුණුව පෙන්නුම් කළ පින්තාරු කළ මැටි බඳුන් හා මැටි පබළු සොයාගත් ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
1. උඩරංචා මඩම 2. තිස්සමහාරාමය 3. ගලේවෙල 4. යටිගල්පොත්ත

07. ගමේ නිෂ්පාදනය කරන දේවල් නගරයට ගෙනයාම සම්බන්ධීකරණය කළ ගමත් පුරයත් අතර පිහිටි අතරමැදි ජනාවාසය මෙරට පැරණිතම සෙල්ලිපිවල හැඳින්වූයේ කුමන නමකින් ද?
1. පුරය 2. නකර 3. නුරුපුර 4. ඔළගම්

08. පූර්ව රාජ්‍ය සමයේ එක් එක් ගම් අතර වැඩකටයුතු කිරීමේ දී සම්බන්ධීකරණය පැවැත්වූයේ කවුරුන් හරහා ද?
1. ගම්වැසියන් 2. පරුමකයන් 3. ගමිකයන් 4. ගොවියන්

09. ශ්‍රී ලංකාවේ අතීත දේශපාලන බලය විකාශනය ආරම්භ වූයේ කුමන ක්‍රමයක් ලෙසට ද?
1. මධ්‍යගත ක්‍රමයක් ලෙස 2. විමධ්‍යගත ක්‍රමයක් ලෙස
3. සමූහාණ්ඩු ක්‍රමයක් ලෙස 4. ඒකාධිපති පාලන ක්‍රමයක් ලෙස

10. AB ප්‍රකාශ ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | කුටකණ්ණ අභය රජතුමා | A | චක්‍රවර්ති |
| 2. | මහසෙන් රජතුමා | B | අලකපය මහරජ |
| 3. | කාශ්‍යප රජතුමා | C | නර ඉසෙර |
| 4. | නිශ්ශංකමල්ල රජතුමා | D | දේවත්ව |

1. BACD 2. CDBA 3. BCDA 4. CBAD

11. රටවැසියන් වෙනුවෙන් ඉටුකරන මහඟු යුතුකම ලෙස රටක භෞමික අඛණ්ඩතාව රැකගැනීමට ක්‍රියාකළ රජතුමා කවුරුන් ද?

1. කාවන්තිස්ස රජතුමා 2. වසභ රජතුමා
3. මහසෙන් රජතුමා 4. I විජයබාහු රජතුමා

12. ක්‍රි. ව. 9 වන සියවසේ ලිය වී ඇති සෙල්ලිපිවල එම සමයේ මෙරට ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක විධායකය හඳුන්වා ඇත්තේ කුමන ආකාරයටද?

1. සභාව 2. එක්තැන් සමය 3. මහලේ 4. ආස්ථාන

13. පහත ප්‍රකාශ සැලකිල්ලට ගෙන පිළිතුරු සපයන්න.

A රෝහල් ඉදිකිරීමට මහත් වෙහෙසක් දැරීම.
B රටේ නොයෙක් ප්‍රදේශවල තිබූ රෝහල්වලට අවශ්‍ය සියලු දේ සැපයීම.
C උණ රෝගීන් සඳහා විශේෂ රෝහලක් ඉදිකිරීම.
D ගැබිණි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා රෝහල් ඉදිකිරීම.

ඉහත දැක්වෙන ජනතා ශුභසාධන කටයුතු අතරින් 5 වන මහින්ද රජතුමා හා I වන උපතිස්ස රජතුමා කළ ශුභසාධන කටයුතු අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A හා B 2. A හා C 3. B හා D 4. C හා D

14. මහාවංශයට අනුව භාතිකාභය රජතුමා විසින් තානාපති නිලධාරීන් යවන ලද රට කුමක් ද?

1. බුරුමය 2. තායිලන්තය 3. රෝමානුක දේශය 4. ඉන්දියාව

15. ක්‍රිස්තු වර්ෂ එකොළොස්වන සියවසේ මෙරට වෙළඳ කටයුතුවලට සම්බන්ධ වූ නා නා දේසි නම් ජන කණ්ඩායම කුමන රටක සම්භවයෙන් යුතු පිරිසක් ද?

1. කාම්බෝජ 2. දකුණු ඉන්දියානු 3. ඇෆ්ගනිස්ථාන් 4. බුරුම

16. වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය හෙවත් පීඩන ශල්කනය භාවිතා කළේ කුමන යුගයේ ද?

1. ප්‍රාග් ඓතිහාසික යුගය 2. මුල් ඓතිහාසික යුගය
3. පූර්ව ඓතිහාසික යුගය 4. නූතන යුගය

17. සුළඟ හා සුළඟේ චලිතය නිසා ඇතිවන තරංගවලින් වැව්බැම්ම ඛාදනය වීම වැළැක්වීමට වැවක ඉදිකළ ව්‍යුහය හඳුන්වන්නේ කුමන නමින් ද?

1. වැව් බැම්ම 2. බිසෝකොටුව 3. සොරොව්ව 4. රළපනාව

18. මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස්කර ඉදිකළ දුවැන්ත ඇළ මාර්ගය කුමක් ද?

1. මිනිපේ ඇළ 2. ඇළහැර ඇළ 3. යෝධ ඇළ 4. රිදී බැඳි ඇළ

19. වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක මල් කැටයම් 21ක් කොටා නූතන රන් කරුවාට අභියෝග කරමින් ආභරණ තාක්ෂණයේ විශිෂ්ඨත්වය කියාපාන රන් තැල්ල හමු වී ඇති ස්ථානය වන්නේ මින් කුමක් ද?

1. ජේතවන කැනීම් භූමියේ දී 2. අභයගිරි කැනීම් භූමියේ
3. ආලාහන කැනීම් භූමියේ 4. ථූපාරාම පුද භූමියේ

20. A කරිසය
B ගුන්ජා
C උසබ
D ආංගුලය

ඉහත මිමි අතරින් අතීත මිනිසා දිගදුර හා කෙටිදුර මැනීමට භාවිතා කළ මිනුම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A හා C 2. A හා B 3. C හා D 4. B හා C

21. අතීත සමාජ ධුරාවලියේ ඉහළින් ම තිබූ තනතුර කුමක් ද?
1. පුරෝහිත 2. රජු 3. ඇමති 4. සේනාපති

22. අතීත සෙල්ලිපිවල බොජකපති ලෙස හඳුන්වා ඇත්තේ කුමන බද්දක් ද?
1. ජලයෙන් අයකළ බද්ද
2. රජුට අයත් ඉඩම්වලින් අය කළ බදු
3. මත්ස්‍යයන්ගෙන් අයකළ බදු
4. වරායවලින් අය කළ බදු

23. පින්තූරයේ දක්වෙන කාසි හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?
1. හස් එබූ කාසි
2. අලියා හා ස්වස්ථික කාසි
3. ලක්ෂ්මී කාසි
4. පුරාණ හෝ ධරණ කාසි



24. A අමණ්ඩ ගාමිණී රජු
B 4 වන මිහිඳු රජු
C නිශ්ශංක මල්ල රජු
D 4 වන කාශ්‍යප රජු
ඉහත සඳහන් රජවරුන් අතරින් මාඝාත නීතිය හා ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බවට නීති පනවන ලද රජවරු යුගලය සඳහන් පිළිතුර තෝරන්න.
1. A හා B 2. B හා C 3. A හා C 4. C හා D

25. භාතියතිස්ස රජුගේ කාලයේ දී තමන් සතු දේපලවලින් කොටසක් බෞද්ධ විහාරයකට පූජාකළ බව සඳහන් වන කාන්තාව කවුරුන් ද?
1. ලීලාවතී රැජින
2. තලතා ලක්ෂ්මී දේවිය
3. චූලසීවලී රැජින
4. අශෝකමාලා කුමරිය

26. ඓතිහාසික සිදුවීම් කීපයක් පහතින් දක්වා ඇත. ඒවා සිදු වූ කාලය අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.
A පන්සිය පනස් ජාතකපොත රචනා කිරීම.
B ඉබන් බතූතාගේ පැමිණීම සිදුවීම.
C ඊජිප්තුව සමඟ වෙළඳ සබඳතා ඇතිකර ගැනීම.
D චන්ද්‍රභානුගේ හමුදාව පලවා හැරීම.
1. D C A හා B ය. 2. A B C හා D ය. 3. C A B හා D ය. 4. D C B හා A ය.

27. කෝට්ටේ රාජධානි යුගයේ දී යාපනය ජයග්‍රහණය කළ සපුමල් කුමරු රාජ්‍යයට පත් වූයේ කුමන නමින් ද?
1. පණ්ඩිත පරාක්‍රමබාහු
2. හයවන බුවනෙකබාහු
3. අටවන වීර පරාක්‍රමබාහු
4. හයවන පරාක්‍රමබාහු

28. රජුට දරුවන් නොමැති වූ විට තම බිසවගේ සොහොයුරාට රජකම උරුමවීමේ සිරිත දක්නට ලැබුනේ කුමන රාජ වංශයේද?
1. මෞර්ය 2. ලම්බකර්ණ 3. නායක්කාර් 4. මානවම්ම

29. ශ්‍රී විජය රාජසිංහ රජු — A සියම් නිකාය ආරම්භ කිරීම.
කීර්ති ශ්‍රී රාජසිංහ රජු — B ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කිරීම.
රාජාධි රාජසිංහ රජු — C උඩරට රාජසභාවේ රදළ බලය වැඩිවීම.
ශ්‍රී වික්‍රම රාජසිංහ රජු — D ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගැනීම.
ඉහත උඩරට රජවරුන් හා සම්බන්ධ ඓතිහාසික සිදුවීම නිවැරදිව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
1. C A D B 2. A B C D 3. A B D C 4. D C A B

- A B C D ප්‍රකාශ පද යුගල අධ්‍යයනය කර 30, 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
1. මුද්‍රණ කර්මාන්තය දියුණුවීම
2. බුද්ධි ප්‍රබෝධය

B
1. ලතින්, ග්‍රීක භාෂා ඉගෙනීම විලාසිතාවක් වීම
2. ප්‍රාදේශීය භාෂා අභාවයට යාම

C
1. පුනරුද සමය
2. නිර්මාණ ආගමික මුහුණුවරක් ගැනීම

D
1. වැඩවසම් ක්‍රමය
2. ප්‍රාදේශීය පාලකයන් ස්වාධීනව කටයුතු කිරීම

30. පළමු වැන්නේ වැඩිවීම දෙවැන්න ඉහළයාමට බල පෑ ප්‍රකාශ/පද යුගලය තෝරන්න.
1. A 2. B 3. C 4. D

31. පළමු වැන්නේ වර්ධනය සමග දෙවැන්න පිරිහීමට හේතු වූ ප්‍රකාශ යුගලය තෝරන්න.
1. A 2. B 3. C 4. D

32. පේරෝලෝපේස් ද සූසා හා I විමලධර්මසූරිය රජු අතර සටන ඇති වූ ස්ථානය කුමක් ද?
1. රන්දෙනිවෙල 2. ගන්නොරුව 3. බලන 4. දන්තුරේ

33. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී උඩරට සේනාංක 6ක් සහිතව ආක්‍රමණයක් එල්ල කරන ලද ලන්දේසි ආණ්ඩුකාරවරයා කවු ද?
1. තෝමස් මෙට්ලන්ඩ් 2. බැරන්වැන්එක් 3. සීබෝල්ද වාට් 4. ෆන් එංගල්බෙග්

34. A ජේම්ස් හාග්‍රීව්ස්
B ඒබ්‍රහම් ඩර්බි
C එඩ්මන්ඩ් කාර්ට්රයිට්
D විලියම් සීමන්ස්
ඉහත පුද්ගලයන් අතරින් පේෂකර්මාන්තයේ දියුණුවට අදාළව නව සොයාගැනීම් කළ තැනැත්තන්ට අදාළ පිළිතුර තෝරන්න.
1. A හා B 2. B හා C 3. C හා D 4. A හා C

35. පහත සඳහන් වන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ සොයාගැනීම් කීපයකි. ඒවා අදාළ පරිදි ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ජෝන් මැකඩම් | A | දුම්බෝට්ටුව |
| 2. | ජෝර්ජ් ස්ටීවන්සන් | B | මෝටර් රථය |
| 3. | රොබට් පුල්ටන් | C | මැකඩම් ක්‍රමය |
| 4. | ඩෙම්ලර් | D | දුම්රිය එන්ජිම |

1. A B D C 2. C D A B 3. D C A B 4. B C A D

36. A භාණ්ඩ නිෂ්පාදනයේ හා අලෙවිකිරීමේ කටයුතුවල නිරත වූ බහුජාතික සමාගම් බිහිවීම
B සමාජවාදය බිහිවීම
C ආනයන අපනයන වෙළඳ ආර්ථිකය ඉදිරියට ඒම
D වෘත්තීය සංගම් බිහිවීම
E පන්ති සහිත සමාජය බිහිවීම
ඉහත ප්‍රකාශ සැලකිල්ලට ගෙන කාර්මික විප්ලවය නිසා ආර්ථික ක්ෂේත්‍රය තුළ ඇති වූ වෙනස්කම් 2ට අදාළ ප්‍රකාශ තෝරන්න.
1. A හා B ය. 2. A හා D ය. 3. A හා C ය. 4. D හා E ය.

37. යුරෝපා ජාතීන් පෙරදිග පිහිටුවා ගත් වෙළඳ මධ්‍යස්ථාන කීපයක් පහත දැක්වේ. ඒවා අතරින් ප්‍රංශ ජාතීන් පිහිටුවා ගත් වෙළඳ මධ්‍යස්ථාන පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. මදුරාසිය, බොම්බාය 2. කල්කටා, මසුලිපට්නම්
3. බතාවිය, චන්ද්‍රනගර් 4. පොන්ඩිචෙරි, කරිකාල්

38. රාජාධි රාජසිංහ රජුගේ කාලයේ ලංකාවට පැමිණි ඉංග්‍රීසි ජාතික දූතයන් අඩංගු පිළිතුර තෝරන්න.
1. ජෝන් පයිබස් හා හියුබොයිඩ් 2. ජෝන් පයිබස් හා රොබට් ඇන්ඩෘස්
3. රොබට් ඇන්ඩෘස් හා හියුබොයිඩ් 4. හියුබොයිඩ් හා පෙඩ්රික් නෝර්ත්

39. මදුරාසි පාලනය යටතේ ලංකවේ මුහුදුබඩ පාලනයට පත් කළ නිලධාරියා හැඳින්වූ නම කුමක් ද?
1. අවුමිල්දාර්වරු 2. කලෙක්ටර්වරු 3. රෙසිඩන්ට්වරු 4. සහකාර පරීක්ෂකවරු

40. බ්‍රිතාන්‍යයන්ගේ කිරීට පාලනය යටතේ මෙරට පාලනයට පත් කළ පළමු ආණ්ඩුකාරවරයා කවු ද?
1. රොබට් බ්‍රවුන්රිග් 2. සර් පෙඩ්රික් නොර්ත්
3. තෝමස් මෙට්ලන්ඩ් 4. ෆන් එංගල්බෙග්

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

33 | S | II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ........................................ ඉතිහාසය - II          කාලය : පැය 03යි.

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය.
- II කොටසින් ප්‍රශ්න 4ක් ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

### I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කොට නම් කරන්න.

(i) මැණික් ගඟ, කලා ඔය, පරාක්‍රම සමුද්‍රය, හුරුළු වැව, මාතොට, කාලතිත්ථ, ගම්පොළ, කයිට්ස්, බුත්තල, පතිරාජවෙල, බලන, මඩකලපුව (ල. 12)


(ii) ගෝව, පර්සියන් බොක්ක, ඉතාලි අර්ධද්වීපය, ජාවා දූපත, මැලේසියානු අර්ධද්වීපය, සින්ධු ගඟ (ල. 6)

(ආ) (i) පහත A,B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධව ඇති පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල. 4)

A - මෙරට ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දෙන ලද රජු
B - කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ආරම්භ වූ බෞද්ධාගමික නිකාය
C - බ්‍රිතාන්‍ය රෙදිපිළි කර්මාන්තයේ රෙදි විවීම වේගවත් කිරීමට ජෝන් කේ විසින් නිපදවන ලද යන්ත්‍රය
D - 1818 ඉංග්‍රීසින්ට විරුද්ධව දියත්කළ නිදහස් අරගලය ආරම්භ වූ ප්‍රදේශ


(ii) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

1. A වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?
2. එය සොයාගත් ස්ථානය කුමක් ද?
3. මෙය කුමන කාලයකට අයත් වූවක් ද?
4. මෙම නිර්මාණය තුළින් අතීත ජනතාවගේ ජීවිතය පිළිබඳ අවබෝධ කරගත හැක්කේ කුමක්ද? (ල. 4)



A

(iii) 1. B වලින් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?
2. ඔහු සොයාගත් උපකරණය කුමක් ද?
3. මෙම උපකරණය සොයාගැනීමට පර්යේෂණ ආරම්භ වූයේ කුමන සියවසේ ද?
4. මෙම උපකරණය නිසා විප්ලවීය වෙනසක් ඇති වූ ක්ෂේත්‍රය කුමක් ද? (ල. 4)



B

## II කොටස

02. (i) පහත සඳහන් වන්නේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප 03කි. එම පරිසර කලාප 03ට අයත් ස්ථාන 03ක් වරහන් තුළින් තෝරා ලියන්න. (ල. 03)
(බටදොඹ ලෙන, මාතොට, අලිගල, රාවණා ඇල්ල)
A - අර්ධ ශුෂ්ක කලාපය
B - පහතරට වියළි කලාපය
C - තෙත් කලාපය

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා වැඩිපුර වාසය කර ඇත්තේ කුමන ලක්ෂණ වලින් යුතු ප්‍රදේශවලද? (ල. 04)

(iii) මෙරට ගල් යුගයේ ජනතාව, ආහාර රටාවේ ලක්ෂණ, තෙත් කලාපයේ හා වියළි කලාපයේ ඔවුන් ජීවත් වූ ගල්ලෙන් 02ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජනතාවගේ මළමිනී තැන්පත් කිරීම සඳහා නිර්මාණය කළ මහා ශිලා සුසාන වර්ගයේ සුසාන ක්‍රම 03ක් නම්කර ඒවායේ මිනී වැලලීම් කළ ආකාරය සඳහන් කරන්න. (ල. 06)

03. (i) අතීත පාලකයන් අතින් රටවැසියන්ට ඉටුවිය යුතුව තිබූ යුතුකම් 03ක් දක්වන්න. (ල. 03)

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් කාර්යයන් කළ රජවරු නම් කරන්න. (ල. 04)
A අනුරාධපුර නගරය ගොඩනැංවීම
B දෙවනපිය අභිධානය භාවිතා කිරීම.
C පරුමුකවරුන්ට විවිධ තනතුරු ලබාදීම.
D විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීම

(iii) මෙරට රජවරු භාවිතා කළ රාජ්‍යත්ව සංකල්ප 02ක් නම්කර පැහැදිලි කරන්න. (ල. 05)

(iv) මෙරට රාජ්‍ය උරුමය සිදු වූ ආකාර 03ක් නම්කර විස්තර කරන්න. (ල. 06)

04. (i) අතීත බුද්ධිමත් රජවරු අසල්වාසී රටවල් සමග සුහදශීලී සබඳතා පවත්වාගත් අවස්ථා කිහිපයක් පහත දැක්වේ. ඒවාට දායක වූ රජවරු ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 03)
A පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම
B රුවන්වැලිසෑයට පූජාවක් සඳහා වීදුරු පබළුගෙන ඒමට රෝමානුක දේශයට යාම
C චීනය සමග විසිවතාවක් රාජ්‍යතාන්ත්‍රික දූත ගමන් සංවිධානය කිරීම.

(ii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ ක්‍රියාත්මක වූ කර්මාන්ත පිළිබඳ සඳහන්වන සෙල්ලිපි හතරක් පහත දැක්වේ. එම සෙල්ලිපිවලින් කියවෙන කර්මාන්ත මොනවාදැයි වරහන් තුළින් තෝරා ලියන්න. (ල. 04)
(යකඩ, මැටි, රන්, ඇත්දත්, රෙදිපිළි)
A පොළොන්නරු දිස්ත්‍රික්කයේ මුතුගල්ල සෙල්ලිපිය
B හම්බන්තොට දිස්ත්‍රික්කයේ මණ්ඩලගිරි සෙල්ලිපිය
C මහනුවර දිස්ත්‍රික්කයේ වේගිරිය සෙල්ලිපිය
D හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙහෙරකෙම සෙල්ලිපිය

(iii) මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු අනුගාමික කණ්ඩායම් මෙරටට වැඩම කිරීමෙන් පසු බුදු දහම හා ඊට අනුබද්ධ වත්පිළිවෙත් මෙරට සමාජයේ පැතිරීගිය ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) අතීත ශ්‍රී ලාංකික සමාජයේ දැනුම ලබාගැනීමට හා පතල කිරීමට සංවිධානාත්මක ක්‍රමවේදයක් පැවති බව එකල පැවති අධ්‍යාපන මධ්‍යස්ථාන ගුරුවරු ඉගැන්වූ විෂය මාලාව තුළින් පැහැදිලි කරන්න. (ල. 06)

05. (i) අතීත ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක භාවිතයේ පරිණතිය පෙන්නුම් කරන්නේ ජලකළමනාකරණය සම්බන්ධයෙනි. ඒ අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වැවට එක්කළ අංග මොනවාද? (ල. 03)
A විශාල ජල ධාරිතාවක් ආරක්ෂාකාරීව රඳවා තබා ගැනීම.
B ජලය මුදාහැරීමේ දී ඇතිවන පීඩන මට්ටම අඩු කිරීම
C වැව් බැම්ම ඛාදනය අවම කිරීම

(ii) පැරණි සමාජයේ ස්වභාව ධර්මයට අයත් භෞතික තත්ත්වයන් මැනීමට භාවිතා කළ මිම් 04ක් පහත දැක්වේ. එම මිම් භාවිතා වූයේ කුමන භෞතික තත්ත්වයන් මැනීමටදැයි සඳහන් කරන්න. (ල. 04)
A කිරිය B පරමාණුව C ගුන්ජා D හවජර

(iii) ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කිරීමේ පැරණි තාක්ෂණය කෙබඳුදැයි වටහා ගැනීමට ඉවහල්වන ප්‍රධාන අවස්ථා 02ක් නම්කර ඒ අවස්ථාවල යකඩ නිස්සාරණය කළ ආකාරය පැහැදිලි කරන්න. (ල. 05)

(iv) පහත සඳහන් වන්නේ අතීත මිනිසා තම නිර්මාණවලට භෞතික විද්‍යා මූලධර්ම අනුගමනය කළ අවස්ථා 03කි. එය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

A පීඩන ශල්කනය

B යම් වස්තුවක් පොළොවට ලම්භාකාර වීමෙන් පොළොව මත ඇතිකරන පීඩනය නිශ්ක්‍රීය වන බව

C ස්ථිතික ජල විද්‍යා මූලධර්මය

06. (i) පොළොන්නරු රාජධානියේ පරිහානියත් දඹදෙණි රාජධානිය බිහිවීමත් අතර කාල පරිච්ඡේදයේ දී රට ජාතිය ආගම සුරැකීමේ අරමුණින් පිහිටුවාගත් ප්‍රාදේශීය ආරක්ෂක ස්ථාන 03ක් පහත දැක්වේ. එම ස්ථාන පිහිටුවාගත් නායකයින් කවුදැයි ලියන්න. (ල. 03)

A - යාපහුව කඳු මුදුන

B - රුහුණේ ගෝවින්දමලය

C - මහියංගනය ආසන්නයේ ගංදෙණිය පර්වතය

(ii) පහත සඳහන් වන්නේ දෙවන නාගරීකරණ යුගයේ වැදගත් සිදුවීම් කිහිපයකි. ඒවා සිදුවූයේ කුමන රාජධානිවලදැයි ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 04)

A - බෙලිගල දළඳා මැඳුරක් කරවීම

B - ඊජිප්තු සුල්තාන් වෙත දූත කණ්ඩායම් යැවීම

C - පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.

D - ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය කරවීම.

(iii) පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු දෙකක් නම් කොට පැහැදිලි කරන්න. (ල. 05)

(iv) කෝට්ටේ රාජධානියේ VI වන පැරකුම් රජුගේ කාර්යයන් සාපල්‍ය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

07. (i) උඩරට රාජධානියේ රජ වූ I වන විමලධර්මසූරිය රජතුමා මුහුණදුන් අභියෝග 3ක් නම් කරන්න. (ල. 03)

(ii) උඩරට රාජධානියේ පරිපාලන කටයුතු බෙදා තිබූ ප්‍රධාන අංශ හතරක් ලියා දක්වන්න. (ල. 04)

(iii) උඩරට රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය රජු විසින් විසඳූ නඩු වර්ග හා වැරදි කරුවන්ට දුන් දඬුවම් ඇසුරින් විමසන්න. (ල. 05)

(iv) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කර පැහැදිලි කරන්න. (ල. 06)

## III කොටස

08. (i) පුනරුද අවධියේ සාහිත්‍යට විශාල සේවයක් කළ පහත සඳහන් කතුවරුන්ගේ මව් රටවල් මොනවාදැයි නම් කරන්න. (ල. 03)

A ඩාන්ටේ

B ෆ්‍රැන්සිස් බේකන්

C ඉරාස්මස්

(ii) පුනරුද සමයේ වැදගත් වෙනසකට භාජනය වූයේ චිත්‍ර කලාවයි. පුනරුදයට පෙර හා පසු චිත්‍ර කලාවේ සිදු වූ වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ල. 04)

(iii) පුනරුද සමයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ සොයාගැනීම් කළ දෙදෙනෙකු නම් කර ඔවුන්ගේ සොයාගැනීම් නම් කරන්න. (ල. 05)

(iv) ගෘහ නිර්මාණ ශිල්පයේ ඇති වූ වෙනස්කම් මධ්‍යතන යුගයේ හා පුනරුද යුගයේ නිර්මාණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

09. (i) පහත A, B, C වලින් දක්වෙන්නේ බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආශ්‍රිත සොයාගැනීම් කිහිපයකි. එම සොයාගැනීම් වලට අදාළ කර්මාන්ත නම් කරන්න. (ල. 03)

A ජෙනී යන්ත්‍රය

B රෝලර් යන්ත්‍රය


C ආරක්ෂක ලාම්පුව

(ii) කාර්මික විප්ලවයට සාපේක්ෂව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධක හතරක් නම් කරන්න. (ල. 04)


(iii) කාර්මික විප්ලවය නිසා ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් 03ක් දක්වා පැහැදිලි කරන්න. (ල. 05)

(iv) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට, මහා මාර්ග ඉදි කිරීමට හා තැපැල් සේවාවට බලපෑවේ කුමන ආකාරයටදැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

01. (අ) (i)
01. (அ) (i)
01. (a) (i)



01. (අ) (i)
01. (அ) (i)
01. (a) (i)



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

33 S I-II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

ඉතිහාසය - පිළිතුරු පත්‍රය


## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 2 | 31. | 2 |
| 02. | 3 | 12. | 2 | 22. | 2 | 32. | 4 |
| 03. | 1 | 13. | 3 | 23. | 1 | 33. | 2 |
| 04. | 4 | 14. | 3 | 24. | 3 | 34. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 2 | 35. | 2 |
| 06. | 1 | 16. | 1 | 26. | 1 | 36. | 3 |
| 07. | 2 | 17. | 4 | 27. | 2 | 37. | 4 |
| 08. | 3 | 18. | 2 | 28. | 3 | 38. | 3 |
| 09. | 2 | 19. | 1 | 29. | 1 | 39. | 3 |
| 10. | 2 | 20. | 3 | 30. | 1 | 40. | 2 |

(ල. 40 × 2 = 80)


## II කොටස

(01) (අ) (i) ලංකා සිතියම




(ල. 12)

(ii) ලෝක සිතියම




(ල. 6)

II කොටස

(ආ) (i)
A දුටුගැමුණු රජතුමා
B සියම් නිකාය
C දුවන නඩාව
D වෙල්ලස්ස (ල 4)

(ii)
1. පබළු මාලය
2. ඉබ්බන්කටුව සුසාන භූමිය
3. ක්‍රි. පූ. 4700 - 4510
4. ජීවන රටාවේ සුඛිත මුදිත භාවය (ල 4)

(iii)
1. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්
2. දුරකථනය
3. 19 වන සියවසේ සිට
4. සන්නිවේදන ක්ෂේත්‍රය (ල. 4)

## II කොටස

02\. (i) 1. මාතොට 2. අලිගල
3. බටදොඹලෙන (ල. 3)

(ii) 1. පහත රට වැසි වනාන්තර
2. වියළි කලාපීය වනාන්තර
3. මුහුදුබඩ කලපු හා විල්ලු
4. කඳුකර තණබිම් (ල. 4)

(iii) දඩයම් කළ සතුන් ආහාර ලෙස ගැනීම
උදා:- ගවරා, වල් ඌරා, ගෝනා, හාවා ආදී
මාංශ ජනක ධාතු බහුල - මිරිදිය මාළු වර්ග
පිෂ්ටය ලබාගැනීමට ශාක ආහාර - වල්දෙල්, කැලෑ කොළ ආදිය ආහාරයට ගැනීම.
වියලි කලාපයේ හා තෙත් කලාපයේ ලෙන් ආශ්‍රිතව මෙම ආහාර අවශේෂ හමු වී ඇත. (පිටු අංක 15)

(iv) 1. ශිලා මංජුසා සොහොන් :- ගල් පතුරු 4ක් ඒකරාශී කර සෑදීම.
2. කුම්භීය නිබනන :-කුඩා මැටි බඳුන් විශාල මැටි බඳුන් වල බහා තැම්පත් කිරීම.
3. මැටි ඔරු සුසානා:- අමු මැටිටෙන් සකස් කළ ඔරුවක හැඩැති බේසමක භෂ්මාවශේෂ තැම්පත් කළ මැටි බඳුන් තැබීම. (ල. 6)

03\. (i) (1) ආරක්ෂාව සැපයීම
(2) ආර්ථික සමෘද්ධිය ඇති කිරීම.
(3) ආධ්‍යාත්මික සුවතාව ඇති කිරීම (ල. 3)

(ii) A පණ්ඩුකාභය රජු
B දේවානම්පියතිස්ස රජතුමා
C දුටුගැමුණු රජතුමා
D වසභ රජතුමා (ල. 4)

(iii) පර්වත රාජ - කාශ්‍යප රජතුමා ආලකමන්දාවේ කුවේර ලෙස සීගිරිය පර්වතය මුල් කරගෙන රජකිරීම.
චක්‍රවර්තී සංකල්පය:- නිශ්ශංකමල්ල රජතුමා සමස්ත ලෝකයටම අධිපති යන බව පෙන්වීමට භාවිතා කිරීම (පිටු අංක 39)

(iv) පියාගෙන් පුතාට - කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජ වීම. වසභගෙන් පසු වංකනාසික තිස්ස රජුට හිමිවීම.
සහෝදරයාගෙන් සහෝදරයාට - දුටුගැමුණු ගෙන් පසු සද්ධාතිස්සට
දේවානම්පියතිස්ස ගෙන් පසු ඔහුගේ සොහොයුරන් රජවීම.
රජුගේ බිසවගේ සොයුරාට - වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ බිසවගේ සොයුරා ලෙස ශ්‍රී විජයරාජසිංහ බලයට පත්වීම. මෙසේ වූයේ හිමිකරුවකු නොවූ විටය. (ල. 6)

04\. (i) A I ගජබා රජු B භාතිකාභය රජතුමා
C 6 වන අග්ගබෝධි (ල. 3)

(ii) A යකඩ කර්මාන්තය
B රන් කර්මාන්තය
C ඇත් දත් කර්මාන්තය
D රෙදි පිළි කර්මාන්තය (ල. 4)

(iii) බුදුදහම ව්‍යාප්තියට කළ දේවල්:-
ගල්ගුහා පිළිසකර කර පූජා කිරීම.
පණ්ණශාලා දක්වා ඒවා විශාල කිරීම.
ඒවා පන්සල් ලෙස හැඳින්වීම.
ධර්ම කොටස් කට පාඩම් කර ව්‍යාප්ත කිරීමට භාණකවරු නම් භික්ෂූන් වහන්සේලා පත් කිරීම. එක් එක් නිකායවලට අදාළව එම ධර්ම කොටස් මතක තබා ගැනීම.
වත්පිළිවෙත් කඨින උත්සව පැවැත්වීම හා හැලඹගල සෙල්ලිපියේ කඨින උත්සව පිළිබඳව සඳහන්වීම.
කොතල තිඹියාව සෙල්ලිපියේ කඨින සිවුරු පිළිබඳ සඳහන්වීම. (ල. 5)

(iv) ගුරුවරු:-සෙල්ලිපිවල අචාර්ය ලෙස දැක්වීම හා අචරිය ආදී ලෙස
අධ්‍යාපන ආයතන:- බෞද්ධ විහාරාරාම අභයගිරිය මුල්කරගෙන බිහිවීම.
විෂයමාලාව:-සිංහල පාලි ආදී විෂයන් ඉගැන්වීම (ල. 6)

05\. (i) A වැව් බැම්ම, B බිසෝ කොටුව
C රළපනාව (ල. 3)

(ii) A කිරිය - අවකාශය, B පරමාණුව - දිගමැනීම
C ගුන්ජා - බර D හවජර - කාලය (ල. 4)

(iii) බලංගොඩ සමනොළ වැව යකඩ නිස්සාරණය ස්වභාවික සුළං බලය මෙහිදී භාවිතා කර ඇත.
සීගිරියේ අලකොළ වැව ප්‍රදේශයේ මයිනහමක ආධාරයෙන් යකඩ උණු කිරීම (ල. 5)

(iv) A පීඩන ශල්කනය - වෙර යොදා බලයක් යොදාගෙන ගල්පතුරු කඩා මෙවලම් සැකසීම.
B සොහොන් බිත්ති නිර්මාණයේ දී බිත්ති අවම උසකින් පොළොවට ලම්බාකාරව බැඳීම තුළින් පොළොව මත ඇතිකරන පීඩනය නිෂ්ක්‍රීය වීම.
C ඇතාගේ උදරයේ තෙල් ගබඩාකර තෙල් ලිංගය හරහා පහතට ගලා ඒමට සැලැස්වීම. තෙල් දැවී අඩුවෙන්ම අනායාසයෙන් උදරයේ තෙල් පහතට ගලා ඒම මෙය සිදුවන්නේ ස්ථිතික ජල විද්‍යා මූලධර්මයෙන්ය. (ල. 6)

06\. (i) A සුභ සෙන්පතියා B බුවනෙකබා ආදිපාද
C සංඛ සෙනෙවියා (ල. 3)

(ii) A දඹදෙණිය B යාපහුව C කුරුණෑගල
D ගම්පොල (ල. 4)

(iii) දුර්වල පාලකයන් බලයට පත්වීම.
කාලිංග පාණ්ඩ්‍ය අතර අරගලය.
ආර්ථික පරිහානිය
කාලිංඝ මාඝගේ ආක්‍රමණ
ආරක්ෂාව නැතිවීම.
මධ්‍ය පාලනය බිඳවැටීම යනාදියෙන් 2ක් විස්තර කරන්න. (ල. 5)

(iv) යාපන රාජ්‍යය සපුමල් කුමරු යවා ජයගැනීම
උඩරට ජෝතිය සිටාණෝ යවා ජයගැනීම.
වන්නි ප්‍රදේශය ජය ගැනීම.
කෝට්ටේ එක්සත් කොට ආර්ථික සංවර්ධනය ඇති කිරීම. (ල. 6)

07. (i) නීත්‍යානුකූල රාජ්‍ය උරුමය නැතිවීම.
උඩරට රාජ්‍ය පෘතුගීසීන්ගෙන් බේරා ගැනීම.
උඩරට රාජ්‍යය සීතාවකින් මුදවා ගැනීම.
පරිහානියට පත් බුදු සසුන නගා සිටුවීම.
මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණුවීම
එයින් 3ක් නම් කිරීමට (ල. 3)

(ii) 1. මහවාසල 2. රටවසම 3. මහා බද්ද
4. විහාර දේවාල (ල. 4)

(iii) **විසඳූ නඩු වර්ගඃ**
වැදගත් නායකයන් සම්බන්ධ නඩු
රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු
කැරලි කෝලාහල පිළිබඳ නඩු
විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු
කුමන්ත්‍රණ නඩු
**වැරදිකරුවන්ට දුන් දඬුවම්ඃ**
අතුල්පහර දීම, දඩ ගැසීම, දඬුකඳේ ගැසීම, ඇතුන්ලවා පාගා මැරීම ආදිය විස්තර කිරීම (ල. 5)

(iv) ලන්දේසීන් වෙළඳ සමාගමට පාඩුවන ගැටුම් වලින් වැලකීම.
උඩරට සමග සාමකාමීව කටයුතු කිරීමට උත්සාහ දැරීම.
උඩරට රජුගේ හොඳ හිත දිනාගැනීමට තෑගි බෝග දීම.
රජු හමුවීමට දූතයන් යැවීම. ලිපි හුවමාරුව, උඩරට වැවෙන කුරුඳු තමන්ට ලබා ගැනීම ආදිය විස්තර කිරීම (ල. 6)
උපසම්පදාව ගෙන්වීමට රජුට නැව් ලබා දීම

## III කොටස

08. (i) A ඉතාලිය, B එංගලන්තය, C ප්‍රංශය (ල. 3)

(ii) **පුනරුදයට පෙරඃ**
ආගමික වශයෙන් වැදගත් වූ පුද්ගලයන් චිත්‍රයට නැගීම (කන්‍යාමරිය තුමිය, යේසුස් වහන්සේව)
නිර්මාණ බොහොමයක් ශ්‍රේණ නමින් එළිදැක්වීම
**පුනරුදයෙන් පසුඃ**
පුද්ගලිකව ස්වාධීන නිර්මාණ බිහිවීම, ලෞකික රසාස්වාදයට මුල් තැන ලැබීම. (ල. 4)

(iii) **විලියම් හාවේ**
මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය සම්බන්ධව වැදගත් සොයා ගැනීම් රාශියක් සොයා ගැනීම.
**පැරසල්සස්**
ලෙඩරෝග සෑදීමට තුඩුදුන් හේතු හා ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීම යන නූතන ඖෂධ විද්‍යාව කෙරෙහි රෝග චිකිත්සක ක්‍රම වල බලපෑම සොයා ගැනීම.
**මයිකල් සර්වෙටස්ඃ**
රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිට වී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී නැවත හදවතට පැමිණ ශරීරය පුරාම විසිරී යාම පිළිබඳ සොයා ගැනීම.

(iv) ගෘහ නිර්මාණ ශිල්පයඃ-
මධ්‍යතන යුගයඃ- උල් කේතු ආකාර හැඩයෙන් යුත් ආරුක්කු, උස් වහල, පිරමීඩ හැඩයේ කුලුනු යොදා තිබීම.
පුනරුද සමයඃ- වටකුරු ආරුක්කු, උස් කුලුනු, අර්ධ ගෝලාකාර ශිඛර ගෘහ නිර්මාණ වල ලක්ෂණ වේ. මෙකල සුබෝපභෝගී මන්දිර සාදන ලදී. (ල. 5)

09. (i) A - රෙදිපිළි කර්මාන්තය
B - යකඩ හා වානේ කර්මාන්තය
C - ගල් අඟුරු කර්මාන්තය (ල. 3)

(ii) * මහා පරිමාණ ගොවිබිම් ආරම්භය
* ශ්‍යාෂ මාරු ක්‍රමය
* සත්ව පාලනය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම
* නව තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතය

(iii) * ධනපති පංතිය හා වෙළඳ පංතිය බිහිවීම
* ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම
* වැටුපට වැඩකරන පිරිසක් බිහිවීම
* බද්ධ ව්‍යාපාර බිහිවීම
* බහුජාතික සමාගම් බිහිවීම යනාදියෙන් 3ක් විස්තර කිරීම.

(iv) **කෘෂිකාර්මික ක්ෂෙත්‍රයටඃ-**
කෝපි කෙටීමට පෙඩ්රික් නෝර්ත් මෝලක් ගෙන ඒම.
තේ වියළීම, වර්ග කිරීම, අපනයන කටයුතු සඳහා සකස් කිරීම සියලු දේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කර තිබීම.
රබර් පිටරට යැවීමට යන්ත්‍ර සූත්‍ර භාවිතය.
**ප්‍රවාහන ක්ෂෙත්‍රයටඃ-**
ගල් හා තාර යොදා මාර්ග තැනීම.
ජල මාර්ග හරහා ලී පාලම්
ඉදිකළ මහාමාර්ග සඳහන් කිරීම
(කොළඹ මහනුවර)
**තැපැල් ඃ-**
රාජකාරි තැපැල් සේවයක් ආරම්භ කිරීම.
අශ්ව කරත්ත මගින් තැපැල් සේවය ආරම්භ කිරීම.
තැපැල් මුද්දරය නිකුත් කිරීම.
තැපැල් කාර්යාල ආරම්භ කිරීම.
ටෙලිග්‍රෑම් ක්‍රමය ආරම්භ කිරීම. (ල. 6)